**කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2023**

---

කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ දිස්ත්‍රික්කයේ කොහුවල සහ මහනුවර දිස්ත්‍රික්කයේ ගැටඹේ ස්ථානගත කිරීමට සැලසුම් කර ඇති ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කොහුවල ගුවන් පාලම සහ ගැටඹේ ගුවන් පාලම යන ස්ථාන 02 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු. මිලියන 11,167 කට සමාන යූරෝ මිලියන 54.974 ක් වන අතර ඉන් රු. මිලියන 10,192 කට සමාන යූරෝ මිලියන 52 ක් සැපයීමට හංගේරියානු ආනයන - අපනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු. මිලියන 975 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2021 අගෝස්තු 16 දින ආරම්භ කරන ලද අතර, 2024 පෙබරවාරි 15 දින වන විට අවසන් කිරීමට නියමිතය.

**1.3 තත්වාගණනය කළ මතය**

මගේ මතය අනුව, මගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලට වන බලපෑම් හැර 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුට ගෙවීම් ප්‍රමාද වී සිදු කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමේ 14.8 වගන්තියට අනුව ගෙවිය යුතු මුදල රු. මිලියන 157.85 ක් විය. කෙසේ වෙතත්, රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 100 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කර නොතිබුණි. | 157.85 | වැරදීමකින් එය මූල්‍ය ප්‍රකාශනවල හෙළි කර නොමැත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව සියලුම ගනුදෙනු සහ සිද්ධීන් වාර්තා කළ යුතුය. |
| (ආ) | අංක. 270 දරන ඉඩම් කොටස සඳහා රු. මිලියන 13.99 ක් වූ ව්‍යවස්ථාපිත වන්දි, ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුවේ (LARC) දීමනා වටිනාකම සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි. එබැවින්, 2023 දෙසැම්බර් 31 දිනට වගකීම් සහ කෙරීගෙනයන වැඩ ශේෂයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 13.99 | ඉඩම් කට්ටි අංක. 270/ 520801/08 සඳහා වන වවුචරය 2023 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත ලැබී නොතිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | අතුරු ගෙවීම් සහතික 20 ක් සඳහා ගෙවිය යුතු රු. මිලියන 2,418.21 ක මුදලක් ණය නියෝජිතායතනයේ එකගතාවයකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ දක්වා තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේදී වගකීම අඩුවෙන් දක්වා තිබුණු අතර ස්කන්ධය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2,418.21 | එකඟ වෙමි. මෙය ඊළඟ මූල්‍ය ප්‍රකාශයේ සිට නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ගැටඹේ සහ කොහුවල ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වූ යෝජනාව 2019 මාර්තු 26 දින අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද එකඟතා කමිටුවක් (CANC) විසින් ඇගයීමට ලක් කරන ලද අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.8.2 වගන්තියට අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුවට සහාය දක්වන භාණ්ඩාගාර සාමාජිකයෙකු ඇතුළු තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් අන්‍යෝන්‍ය එකඟතාවයෙන් අවසන් කිරීම් සඳහා නිර්දේශ ලබා ගත යුතුය. කෙසේ වෙතත්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ අනුව ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර භාණ්ඩාගාරයේ සාමාජිකයෙකු නොමැති තාක්ෂණික කමිටුවක් විසින් ලබා දුන් නිර්දේශ මත පදනම්ව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර එය 2023 මැයි 31 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණය මත 2023 ජූලි 04 දින අමාත්‍ය මණ්ඩලය විසින් එම සංදේශය අනුමත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ ඉදිකිරීම් අත්හිටුවීමට මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් අතිරේක ගිවිසුමක් අත්සන් කර තිබුණි. එබැවින්, රේඛීය අමාත්‍යාංශය සහ අධිකාරිය විසින් අත්සන් කරන ලද අතිරේක ගිවිසුම සඳහා නිසි ක්‍රියා පටිපාටි අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. | එකඟ නොවෙමි. කොන්ත්‍රාත්කරු වැඩ අත්හිටුවීමේ නිවේදනය ඉදිරිපත් කරන අවස්ථාවේදී, ඔවුන් සමස්ථ පිරිවැය හිමිකම් පෑමක් ඉදිරිපත් කර නොමැත. යුරෝ. 448,452.56 ක හිමිකම් පෑම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුහි සීමාව තුළට ඇතුලත් වේ. එබැවින්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට සහාය වීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව අමාත්‍යාංශය විසින් පත් කෙරුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු දැනට ආසන්න සමස්ථ බිල්පත ඉදිරිපත් කර ඇති අතර එය අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් අගයනු ලබයි. ඒ අනුව, සුදුසු තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමට භාණ්ඩාගාරය විසින් කඩිනමින් පියවර ගනු ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා විසින් නිසි පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ බලධාරීන්ට දැනුම්දිය යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන උල්ලංඝනය කරන ලද නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමේ 19.2 වගන්තියේ සඳහන් පරිදි අදාළ සිදුවීම පිළිබඳව දැනුවත් වීමෙන් පසු දින 14 ක් ඇතුළත කොන්ත්‍රාත්කරු විසින් එය දැන්වීමටත් ණය ගිවිසුමේ 20.1 වගන්තියේ සඳහන් පරිදි කොන්ත්‍රාත්කරු විසින් හැකි ඉක්මනින් සහ සිදුවීම හෝ තත්වය පිළිබඳව දැනුවත් වී දින 28 කට නොඅඩු කාලයකදී වැඩ අත්හිටුවීම සඳහා දැනුම්දීම පිළිබඳව නොසලකා ගැටඹේ ගුවන් පාලම සඳහා දින 433 ක කාල දීර්ඝ කිරීමක් (EOT) උක්ත 3.1.(අ) ඡේදයේ සඳහන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි 2.4 උප වගන්තියට යොමුව ව්‍යාපෘතියට මූල්‍ය පහසුකම් සැලසීම පිළිබඳ සාධාරණ සාක්ෂි ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරු 2022 අප්‍රේල් 22 දින සේවායෝජකයාගෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වෙතත්, පැවති ආර්ථික අර්බුදය යටතේ මුදල් අමාත්‍යාංශයට එවැනි තොරතුරු තහවුරු කිරීමට නොහැකි වූ බැවින් සේවායෝජකයාට නිශ්චිත පිළිතුරක් ලබා දිය නොහැකි විය. එබැවින් 2022 මැයි 20 න් පසු ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ඕනෑම අවස්ථාවක වැඩ අත්හිටුවීම හෝ වැඩ ප්‍රමාණය අඩු කිරීම දැනුම් දිය හැකිය. | නුසුදුසු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන අමතර පිරිවැය, එම නිර්දේශ ඉදිරිපත් කළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්කරු විසින් හැකි ඉක්මනින් සහ සිදුවීම හෝ තත්වය පිළිබඳව දැනුවත් වී දින 28 කට නොඅඩු කාලයකදී වැඩ අත්හිටුවීම සඳහා දැනුම්දීම පිළිබඳව වූ කොන්ත්‍රාත් ගිවිසුමේ 20.1 වගන්තිය නොසලකා කොහුවල ගුවන් පාලම සඳහා දින 315 ක කාල දීර්ඝ කිරීමක් (EOT) උක්ත 3.1.(අ) ඡේදයේ සඳහන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. සේවායෝජක විසින් 14.7 උප වගන්තියට “ගෙවීම් කාලය" අනුකූල නොවීම හේතුවෙන්, කොන්ත්‍රාත් ගිවිසුමේ 16.1 වගන්තියට අනුව වැඩ ප්‍රමාණය අඩු කරන බව සඳහන් කරමින් 2022 ජුනි 27 දින කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වෙතත්, ඉල්ලීම් අනුව කොන්ත්‍රාත්කරු වැඩ අත්හිටුවා නොතිබුණු අතර, කොන්ත්‍රාත් ගිවිසුමේ වගන්ති අංක 20.1 පිළිබඳ නොසලකා මෙම ඉල්ලීම සහ සන්තකය සේවා යෝජකට භාරගැනීම ප්‍රමාදවීම හේතුවෙන් වැඩබිම කොන්ත්‍රාත්කරුට පැවරීම | පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මුදල් අමාත්‍යාංශයට එවැනි තොරතුරු තහවුරු කිරීමට නොහැකි වූ බැවින් නිශ්චිත පිළිතුරක් ලබාදීමට සේවායෝජකයට නොහැකි විය. එබැවින් 2022 මැයි 20 දිනෙන් පසු ඕනෑම අවස්ථාවක වැඩ අත්හිටුවීම හෝ වැඩ ප්‍රමාණය අඩු කිරීම පිළිබඳව දැනුම් දීමට කොන්ත්‍රාත්කරුට ගිවිසුම් ප්‍රකාරව හැකිවනු ඇත. | දුර්වල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා පරීක්ෂණයක් පවත්වා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කරන ලද නුසුදුසු නිර්දේශ නැවත ඇගයීමට ලක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාදවීම සලකා බැලීමට තාක්ෂණික ඇගයීම් කමිටුව කටයුතුකර තිබුණි. | | |
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුමේ 14.2 වගන්තියට අනුව සේවායෝජකයා විසින් යුරෝ මිලියන 10 ක අත්තිකාරමක් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණි. 2023 ඔක්තෝබර් 25 දින සේවායෝජක ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අත්හිටුවීමට තීරණය කළද, එම අවස්ථාවේදී යුරෝ මිලියන 7.23 ක අත්තිකාරම් ශේෂයක් අයකර ගැනීමට තිබූ අතර කොන්ත්‍රාත්කරුට යුරෝ මිලියන 6.14 ක හිඟ ගෙවීමක් තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අත්හිටුවන අවස්ථාවේ දී මෙම ශේෂයන් සලකා බලා නොතිබුණු අතර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(ඉංජිනේරු) විසින් පත්කරන ලද, ප්‍රමාද ගෙවීම් හේතුවෙන් මූල්‍ය ගාස්තු ඇගයීම වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යුරෝ 448,452.56 ක මූල්‍ය ගාස්තු ගෙවීමට නිර්දේශ කර තිබුණි. | සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරුට සිදුකරනු ලබන ප්‍රමාද ගෙවීම් සඳහා වූ මූල්‍ය ගාස්තුද කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ කොන්දේසි වලට අනුකූල වේ. මෙම ගෙවීම් දෙකම එකගතාවයෙන් අවලංගු කිරීමට කිසිදු බාධාවක් ඇති නොකරයි. එකඟතාවයෙන් අවලංගු කිරීමේ අරමුණ වූයේ සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තුව සැලකිය යුතු ලෙස උල්ලංඝනය කිරීම හේතුවෙන් සේවායෝජකයාට ඇති විය හැකි අවදානම අවම කිරීමයි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් දුර්වල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කරන ලද නුසුදුසු නිර්දේශ නැවත ඇගයීමට ලක් කළ යුතුය. |
| (ඉ) | නීතිපති අනුමැතිය ලබා නොගෙන 2023 ඔක්තෝබර් 25 දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා කොන්ත්‍රාත්කරු සමඟ ව්‍යාපෘතිය අත්හිටුවීම සඳහා අතුරු ගිවිසුමකට එළඹ තිබුණි. | අවබෝධතා ගිවිසුමේ වලංගු කාලය හැර අතුරු ගිවිසුම මගින් අවබෝධතා ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ කිසිදු නියමයක් හෝ කොන්දේසියක් වෙනස් කර නොමැත. | එවැනි අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා නීතිපති මතය ලබාගැනීමට කටයුතු කළයුතු අතර අනාගතයේදී එවැනි අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.8.2 වගන්තියට අනුව ව්‍යාපෘතියේ ගෙවීම් ප්‍රමාදය හේතුවෙන්, මූල්‍ය ගාස්තු ඇගයීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුවට සහායවීම සඳහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ඇතුළුව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කළ යුතුය අතර | කරුණාකර 3.1.(ආ) ඡේදයෙහි සඳහන් පිළිතුර බලන්න. | නුසුදුසු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන අමතර පිරිවැය, නුසුදුසු නිර්දේශ ඉදිරිපත් කළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය යටතේ ජාතික ප්‍රසම්පාදන ආයතනය (NPA) විසින් එය පත් කරනු ලැබේ. කෙසේ වෙතත්, කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ව්‍යාපෘතියේ ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් මූල්‍ය ගාස්තු ඇගයීම සඳහා පත් කරන ලද තාක්ෂණික කමිටුවට භාණ්ඩාගාරයේ සාමාජිකයෙකු ඇතුළත් නොවුණු අතර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමද සිදුකර තිබුණි. එබැවින්, යුරෝ 448,452.56 ක මූල්‍ය ගාස්තු ගෙවීමේ නිර්දේශය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව නිසි තාක්ෂණික ඇගයීම් කමිටුවක් යටතේ ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (උ) | පහත සඳහන් කොන්ත්‍රාත් කටයුතු සම්පූර්ණ කිරීමෙන් තොරව කොහුවල ගුවන් පාලම 2024 ජූලි 17 දින සිට මහජනතාවට විවෘත කර තිබුණි.<br>• පිළියන්දල අන්තයේ සේවා මාර්ග කටයුතු<br>• කොළඹ අන්තයේ සේවා මාර්ග කටයුතු<br>• පිළියන්දල අන්තයේ ප්‍රවේශ ජලාපවහන කටයුතු<br>• පිළියන්දල අන්ත ප්‍රවේශ ජලාපවහන කටයුතු<br>• පදික මංතීරුව ඉදිකිරීම.<br>• කොහුවල මංසන්දියේ ජලාපවහන කටයුතු සහ මංසන්දිය වැඩිදියුණු කිරීම<br>• මංසන්දිය සංඥාකරණය<br>• ගුවන් පාලමේ සහ සේවා මාර්ගවල වීදි ලාම්පු සවි කිරීම<br>• ගුවන් පාලමේ ජලාපවහන කටයුතු | මහජනතාවගේ දුක්ගැනවිලි සැලකිල්ලට ගනිමින් රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙය සිදු කරන ලදී. | ඉතිරි වැඩ කටයුතු නිම කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | රේඛීය අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී සිදු කරන ලද මූලික අධ්‍යයනයට අනුව, කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමෙන් ජාතික ආර්ථිකයට දිනකට රු. මිලියන 4.25 ක වියදමක් ඉතිරි කර ගත හැකි බව හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම ව්‍යාපෘතියේ ප්‍රතිඵල ප්‍රමාද වීමට හේතු වන බව නිරීක්ෂණය විය. | එකඟ වේ. කෙසේ වෙතත්, ප්‍රමාදයට හේතු වූ කරුණු අනපේක්ෂිත සහ සාර්ව ස්වභාවයක් ගත් අතර, එය සේවායෝජකයාගේ පාලනයෙන් මෙන්ම විෂය පථයෙන් තොර විය. | නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 පද්ධති හා පාලන

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ගැටඹේ ගුවන් පාලම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 07 වගන්තිය යටතේ ඉඩම් කට්ටි 152 ක් ගැසට් කර තිබුණද, 2023 වසර අවසන් වන තෙක් එම ඉඩම් කැබලි සඳහා තක්සේරු වාර්තා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ලබාගෙන නොතිබුණි. ඊට අමතරව, කොහුවල ගුවන් පාලම සඳහා අත්පත් කරගත් මුළු ඉඩම් කැබලි 160 න් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ඉඩම් කැබලි 91 ක වන්දි ගෙවීම පමණක් සම්පූර්ණ කර තිබුණි. එබැවින්, ගුවන් පාලම් දෙකෙහිම ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | කොහුවල ප්‍රගතිය ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම්පත්‍ර ප්‍රමාද වී ඉදිරිපත් කිරීම සහ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වාර්තා ප්‍රමාද වී නිකුත් කිරීමය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කොහුවල ගුවන් පාලම සඳහා අත්පත් කරගත් ඉඩම් කැබලි 51 ක් සඳහා වන්දි ගෙවීම ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් සම්පූර්ණ කර තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය ප්‍රකාර සහතිකය, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ලබාගෙන නොතිබුණි. | එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර ඇත. කැබලි 5 ක කටයුතු පමණක් සකස් කර තිබුණු අතර ඒ සඳහා 44(1) වගන්තිය යටතේ කටයුතු කිරීමට සූදානමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |